www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බියකරු ලෙස වර්ධනය වන එක්සත් ජනපද-චීන ආතතීන්

## A dangerous rise in US-China tensions

**2010 පෙබරවාරි 05**

පසුගිය සිකුරාදා තායිවානයට ඩොලර් බිලියන 6.4ක අවි විකිනීම පිලිබඳව එක්සත් ජනපදය නිකුත්කල නිවේදනය, චීනයේ දැඩි විරුද්ධත්වයට ලක්වූ අතර ප්‍රමුඛ බලවතුන් දෙදෙනා අතර ආතතීන්ගේ ඉහල නැගීමක් සනිටුහන් කලේය. ප්‍රතිවිපාක පිලිබඳ නොවිමසාම දැඩි ස්ථාවරයක් ගැනීමට දෙපාර්ශවයම පෙන්වූ අදිටන, රාජ්‍ය තාන්ත්‍රික හා ආර්ථික සබඳතාවල විවෘත භේද භින්න වීමක් පිලිබඳ බියකරු නිමිත්තක් පිලිබිඹු කරයි.

එක්සත් ජනපද පාර්ශවයෙන් ගත් කල, අවි අලෙවිය නිවේදනය කිරීමට ගත් තීන්දුව වනාහි, චීනයේ විරෝධයට ලක්වනු ඇත යන්න පිලිබඳව යහමින් දැනුවත්ව බෙයිජිංහි වැඩෙන ගෝලීය සහ දේශපාලන අධිකාරියට අභියෝග කිරීමට ගනත් බලා ගන්නා ලද තීන්දුවකි. පෙබරවාරි 02 දින *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පතේ පලවූ ලිපියක, ඔබාමා පාලන තන්ත්‍රය ''යලි ඉදිරියට යාම අරඹා ඇතැ''යි සඳහන් කලේය. ආයුධ තොගය පිලිබඳ නිවේදනය, 1972 වසරේ ඇමරිකාව ඒකීය-චීනයක් පිලිගැනීමේ තැන් පටන් දෙරට අතර පැවති සංවේදී රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධයේ හදවතට එල්ල කල සෘජු පහරකි.''

''ජනාධිපති බුෂ්, 2008 වසරේදී තායිවානය සමග මෙවැනිම ආයුධ ගනුදෙනුවක් නිවේදනය කිරීමෙන් අනතුරුව මෙතරම් ඉක්මනින් සිදුවූ මෙම අවි ගනුදෙනුවෙන්, බෙයිජිනය අතිශයින් කුපිත වූ අතර බෙයිජිනය සහ තායිවානය තම අන්‍යොන්‍ය සබඳතා වර්ධනය කරගැනීමේ සාකච්ඡා පවත්වමින් සිටින මොහොතක එය සිදු කෙරුනු'' බව *නිව් යෝර්ක් ටයිම්ස්* පැහැදිලි කලේය. එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන්, ඉරානයේ පරමානු වැඩ පිලිවෙල මත ඉරානයට එරෙහිව නව සම්බාධක පැනවීමට බෙයිජිනය එකඟ නොවීම ගැන ප්‍රසිද්ධියේ චෝදනා කල දිනයේදීම, මෙම නිවේදනය ප්‍රකාශයට පත්විය. චීනයේ විරෝධතා නොතකා ඔබාමා සහ ටිබෙටයේ දලයි ලාමා අතර හමුවක් සිදුවෙනු ඇතයි සඳහන් කිරීමෙන් වොෂිංටනය, තුවාලය තව තවත් පෑරුවේය.

ඉරානයට එරෙහි තදබල ආස්ථානයක් ගන්නා ලෙස කරන බලපෑම චීනය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම, වොෂිංටනයේ කනස්සල්ලට හේතුවූ එක් කාරනයකි. පසුගිය වසරේ බෙයිජිනයට කල සංචාරය අතරතුරදී ඔබාමා, ඩොලරයට සාපේක්ෂව යුවාන් මුදල අධිප්‍රමානය කරන ලෙසත්. කාබන් විමෝචනය පිලිබඳව නිශ්චිත සීමාවන්ට එකඟ වන ලෙසත් සිය චීන ප්‍රතිවාදීන්ට බලපෑම් කලේය. මුදල අධිප්‍රමානය කිරීම පිලිබඳව තර්ජනාංගුලිය එල්ල කලා පමනක් නොව ඔබාමා , ආර්ථික කලමනාකරනය ගැන අවධානය යොමුකිරීමේ අවශ්‍යතාව පිලිබඳව ද දේශනාවක් කලේය. කෝපන්හේගන් දේශගුනික සමුලුවේ දී අවසන් මොහොතේ පැවති සාකච්ඡාවන් සඳහා පහල මට්ටමේ නිලධාරීන් පිරිසක් සහභාගි කරමින් චීන අගමැති, එක එල්ලේම ඔබාමා සමච්චලයට ලක් කලේය.

විශේෂයෙන්ම චීනය සංවේදීව සිටින කාරනා පිලිබඳව වොෂිංටනය ගත්තේ ''පස්සට තල්ලු කිරීමේ'' පිලිවෙතකි. නව ඇමරිකානු පදනමේ විදේශ ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ස්ටීව් ක්ලෙමන්ස් *නිව් යෝර්ක් ටයිම්ස්* වෙත මෙසේ අදහස් දැක්වීය: ''චීනය මේ දිනවල දැඩි ආත්ම විස්වාසයකින් සිටින නමුත් ඔවුන් කැලඹීමට පත් කරන

එක් කාරනයක් නම්, තමන්ගේ ස්වයිරී භාවය යි . . . .ඒ අනුව තායිවානය හෝ ටිබෙටය සම්බන්ධ ඕනෑම කාරනයක් ඔවුන් අපහසුතාවයකට පත් කරනු ඇත.''

තායිවානය තමන්ට ද්‍රෝහී පලාතක් ලෙස සලකන බෙයිජිනය, තායිපේ කිසියම් විටෙක නාමිකව හෝ තමන් වෙනම රාජ්‍යයක් යයි ප්‍රකාශ කල හොත්, එම දේශය ආක්‍රමනය කරන බවට තර්ජනය කර තිබේ. 1949 චීන විප්ලවයෙන් අනතුරුව තායිවානය මත කුවෝමින්ටාන් ආඥාදායකත්වය තහවුරු කිරීමට වොෂිංටනය පිටුබලය සැපයූවද 1972 චීනය සමඟ එකඟත්වයකට පැමිනියේය. එකඟත්වය සෑමවිටම ප්‍රතිවිරෝධයන්ගෙන් ගහන විය: තායිවානය ද ඇතුලත්වන එක්-චීන දේශයක් පිලිබඳ ප්‍රතිපත්තිය මත තායිවානය පිලිබඳ බෙයිජිනයේ අයිතිය එක්සත් ජනපදය විසින් පිලිගැනුනු නමුත්, කුමන හෝ බලහත්කාරී ඈඳගැනීමකට විරුද්ධ වීමද චීනයේ විරෝධය නොතකා තායිවානයට ආයුධ විකිනීමද අඛන්ඩව සිදුවිය.

තායිවානයේ නිදහස පිලිබඳ ඕනෑම පියවරක්, චීනයේ අනෙකුත් කලාපවල -ටිබෙටය මෙන්ම සිංජියැන්ග් පලාතේ උයිගර් මහජනතාව අතර ද- බෙදුම්වාදී ව්‍යාපාර උසි ගන්වනු ඇතැයි යන්න පිලිබඳව චීනය විශේෂයෙන් සංවේදීය. පසුගිය මාසයේදී එක්සත් ජනපදය තායිවානයට අවි විකිනීම පිලිබඳව ඇඟවුම් කල විට බෙයිජනය, අභ්‍යවකාශයේ ගුවන්ගත කර තිබූ සිය චන්ද්‍රිකාවක් විනාශ කිරීම සඳහා බැලැස්ටික් මිසයිල්-විරෝධී පද්ධතිය ක්‍රියාත්මක කරමින්, ඔවුන්ගේ නොසතුට පල කලේය.

පසුගිය සතියේ නිවේදනයෙන් අනතුරුව, අවි ගනුදෙනුවල යෙදෙන එක්සත් ජනපද සමාගම්වලට එරෙහිව සම්බාධක පැනවීමට තර්ජනය කිරීමෙන් චීන පාලානාධිකාරිය පෙර නොවූ විරූ පියවරක් ගන්නා ලදි. එවැනි පියවරක් බෝයිං, යුනයිටඩ් ටෙක්නොලොජීස්, ලොක්හීඩ් මාර්ටින් සහ රේතියන් වැනි එක්සත් ජනපද සමාගම්වලට තදබල පහරක් වනු ඇත. 2028 වසර වන විට ඩොලර් බිලියන 400 ක් වන නව ගුවන් යානා 3,770ක වෙලඳ පොල, ප්‍රතිවාදී එයාර්බස් සමාගමට හිමිවනු ඇතැයි බෝයිං සමාගම සිය නොසතුට පල කලේය. එමෙන්ම චීනය ක්ෂනිකව ම එක්සත් ජනපදය සමග මිලිටරි ගනුදෙනු අත්හිට වූ අතර නිල වශයෙන් එක්සත් ජනපද තානාපතිවරයා වෙත සිය විරෝධය පල කලේය.

එක්සත් ජනපදය හා චීනය අතර වෙලඳ ආතතීන් දැනටමත් වර්ධනය වෙමින් පවතී. චීන වානේ නිෂ්පාදන සහ ටයර් මත වොෂිංටනය තීරුබදු වැඩි කිරීමට ගත් පියවර කෙරෙහි බෙයිජිනය කෝපයෙන් ප්‍රතිචාර දැක්වූයේ, තමන් ද එකට එක කරන බවට තර්ජනය කරමිනි. කෙසේ වෙතත්, ජනාධිපති ඔබාමා මෙම සතියේදී කඩිමුඩියේම සෙනෙට් සභාවේ ඩිමොක්‍රටිකයන් හමුවේ කියා සිටියේ, සිය පාලානාධිකාරිය ''චීනය සහ අනෙකුත් රටවලට ඔවුන්ගේ වෙලඳපොලවල් අන්‍යොන්‍ය වසයෙන් විවෘත කරන ලෙසට අඛන්ඩව බලපෑම් කරන බවත්, පවත්නා [වෙලඳ] නීති ක්‍රියාත්මක කිරීම සඳහා දැඩි පිලිවෙතක් අනුයන'' බවත් ය. මෙම දහනශීලී වාතාවරනය තුල චීනය, බෝයිං සමාගම මත සම්බාධක පැනවීම පූර්න වෙලඳ යුද්ධයක් ඇවිලීමේ ශක්‍යතාවක් අන්තර්ගත කර ගනී.

වැඩෙමින් පවත්නා ආතතීන් පිලිඹිඹු කරන්නේ, භූ දේශපාලනික ප්‍රශ්න පිලිබඳව සිදුවෙමින් තිබෙන තියුනු පරිවර්තනයකි. බෙයිජිනය සම්පත් සහ වෙලඳපොල ප්‍රවේශයන් සුරක්ෂිත කරගැනීමට මංසෙවීමේ ප්‍රතිපලයක් වසයෙන්, භූගෝලයේ සෑම අස්සක් මුල්ලකම ඉස්මතුවෙමින් තිබෙන චීනයේ වැඩෙන ආර්ථික හා මූලෝපායික අභියෝගයන්ට, පිරිහෙමින් පවතින නමුත් තවමත් අධිකාරි බලයක් ලෙස පවතින එක්සත් ජනපදය මුහුන දී සිටී. මැද පෙරදිග සහ මධ්‍යම ආසියාව යන ප්‍රමුඛ බල ශක්ති සම්පත් වලින් පොහොසත් කලාපයේ අධිකාරී තත්වයක් පවත්වා ගැනීමේ වෑයමක් ලෙස ඇෆ්ගනිස්ථානයේ සහ ඉරාකයේ නව විජිතකරන ආක්‍රමනයන් වඩාත් දැඩි කිරීමට එක්සත් ජනපදය වියරු ලෙස තැත් කරමින් සිටී. තම ''පිලිකන්න'' ලෙස සලකන මධ්‍යම ආසියානු කලාපයෙන් එක්සත් ජනපදය ඉවත් කර තැබීමට චීනය

උත්සාහ කරන අතර, තම යෝධ තෙල් සහ ගෑස් සැපයුම් සහතික කරගැනීමටත් තමන්ගේ සන්ධානයන් ශක්තිමත් කරගැනීමටත් වෑයම් කරමින් සිටී.

ගෝලීය මූල්‍යමය අර්බුදය මැද්දෑවේ වසරකට පෙර බලයට පත්වීමෙන් අනතුරුව ඔබාමා, චීනයේ සහයෝගය අපේක්ෂා කලේය. දැවැන්ත ගෙවුම් ශේෂයකට මුහුනපා සිටි තත්වය හමුවේ, ජී20 සංවිධානය හරහා අර්බුදය පිලිබඳ සාකච්ඡාවන්ට බෙයිජිනය සහභාගි කරවා ගත් ඔබාමාගේ නිලධාරීහු, දිගටම එක්සත් ජනපද බැඳුම්කර මිලදී ගන්නා ලෙසට බෙයිජිනයෙන් අයැද සිටියහ. ශුභවාදී ඇතැම් කොටස්, ලෝක ආර්ථිකයේ ගැටලු සහජීවනයේ ජීවගුනය තුලින් විසඳනු ඇති එක්සත් ජනපද = චීන ජී2 සංවිධානයක් පිහිටුවීම පිලිබඳව පවා අනාවැකි පල කලහ.

එක්සත් ජනපදයේ විසංවාදී ප්‍රවේශයත්, චීනයේ අධිෂ්ඨානශීලී ප්‍රතිරෝධයත්, දෙරටෙහිම ධනපති පංතිය මුහුන දී සිටින සමහන් කල නොහැකි ආර්ථික, දේශපාලනික සහ සමාජීය ප්‍රතිවිරෝධතා එලිමහනට ගෙන එයි. අභ්‍යන්තර වසයෙන් ඉලක්කම් දෙකේ විරැකියාවත්, දැවැන්ත මූල්‍ය කප්පාදුවල ප්‍රතිපල වශයෙන් චීනයේ වියදමින් ඇමරිකන් ආර්ථිකයට වාසි සලසා ගැනීමට හා එක්සත් ජනපදය තුල ගැඹුරු වෙමින් පවත්නා සමාජ අර්බුදය කෙරෙහි සිය වගකීම දේශපාලනිකව වසංකිරීම සඳහාත් ඔබාමා, වියරු සහගතව චීන තුරුම්ප්පුව යොදාගනිමින් සිටී.

චීනය සම්බන්ධයෙන් ගත් කල, එරටෙහි ''පිම්බෙන සුලු'' වර්ධන අගයක් පැවතියේ නමුත්, එහි ප්‍රධාන කර්මාන්ත ආරක්ෂනවාදී පිලිවෙත් මගින් ප්‍රහාරයට ලක් වුවහොත් උග්‍රවනු ඇති සමාජ නොසන්සුන්තාව හා පිම්මේ නැගෙන විරැකියාව, බෙයිජනය මුහුන දී සිටින ගැටලු ලෙස පවතියි. පාලන තන්ත්‍රයේ දැවැන්ත මූල්‍ය උත්තේජක විධික්‍රමයන්, මූල්‍ය බිඳවැටීමක බිය සාංකා මතුකරමින්, කොටස් සහ තත්‍ය දේපොල වෙලඳපොලෙහි සමපේක්ෂන උන්මාදයක් අවුලුවා තිබේ. ඔබාමා මෙන්ම චීන නායකයින්ද සමාජ අසමානතාව අතින් ලෝකයේ අග්‍ර ගන්‍ය සමාජයන්ගෙන් එකක් නිර්මානය කිරීමෙහිලා තමන් ඉටුකර තිබෙන භූමිකාව වහංකරනු වස්, තමන් කටයුතු කරන්නේ චීනයේ අවශ්‍යතා සුරක්ෂිත කිරීමට බව කියාපාන අතර වර්ගවාදී තුරුම්පුව යොදා ගනියි.

සැබෑ අනතුර වන්නේ, 1930 ගනන්වල ලෝක ධනවාදයේ පසුගිය මහා අර්බුදය තුලදී සිදුවූවාක් මෙන් සබඳතාවන්ගේ වේගවත් කඩා වැටීමකට සහ වෙලඳ යුද්ධයකට හා සමස්ත මිලිටරි ගැටුමක් පුපුරායාමේ කේන්ද්‍රීය කාරනාව තායිවානය, ටිබෙටය හෝ වෙනත් ප්‍රශ්නයක් වීමට ඉඩ තිබීමයි.

**ජෝන් චැන්**

© www.wsws.org